**ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 266 - වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 18 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිළධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරිගේ හා ගණන්දීමේ නිළධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

-------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 254.90 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 253.45 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.45 හෙවත් සියයට 0.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 194.90 | 193.63 | 1.27 | 0.65 |
| මූලධන | 60.00 | 59.82 | 0.18 | 0.30 |
| **එකතුව** | **254.90** | **253.45** | **1.45** | **0.57** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 19 ක් හා දෙපාර්තමේන්තු 14 ක් විසින් එකතුව රු.මිලියන 1,482.37 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,461.82 ක් උපයොජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 20.55 ක් හෙවත් සියයට 1.39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 26601 යටතේ රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 14.00 | 13.99 | 8.00 | 11.96 | 42.00 | 36.74 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පොදු තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 72.89 ක් විය.විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/000/00/0013/0083/000 | 40.52 |
| 6000/000/00/0014/0014/000 | 0.94 |
| 6000/000/00/0016/0072/000 | 31.43 |
| **එකතුව** | **72.89** |

## 2.4 විගණන නිරීක්ෂණය

වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙළ කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ
---------------------------------------------

3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම
---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

3.2. විසර්ජන ගිණුම
-------------------

3.2.1 අයවැය විචලනය
---------------------

වැය විෂයයන් 3 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට 15 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන
------------------------------------------------------------------------

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන**
------------------------------------------------------------------------------------

(i) නැවත ස්ථානගත කරන ලද සින්නඩම්පන් හා පරසන්කුලම් ගම්මානවල සවි කිරීම සඳහා සූර්ය තාප විදුලි බල්බ 66 ක් රු.මිලියන 5.09 කට මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික වශයෙන් තරඟකාරී ලෙස ලංසු කැඳවා නොතිබුණි.

(ii) සින්නඩම්පන් ගම්මානයට විදුලි බල මණ්ඩලය විසින් විදුලිය ලබා දී තිබිය දි සූර්ය තාප වීදි ලාම්පු 60 ක් සවි කිරීම සඳහා වැයකළ රු.මිලියන 4.62 ක මුදල නිෂ්කාර්ය වියදමක් විය.

(iii) පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා පරසන්කුලම් සහ සින්නඩම්පන් ප්‍රදේශයේ ඉඩම් අක්කර 80 ක් ශුද්ධ කර පවුල් 150 ක් පදිංචි කරවීමට කටයුතු කර තිබුණු අතර ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී පුද්ගලයන් 76 දෙනෙකු පමණක් පුන්තෝට්ටම් සුභසාධක කඳවුරෙන් තෝරාගෙන තිබුණි. ඉතිරි අය තෝරාගැනීමේ පදනම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන**
------------------------------------------------------

ගොවි භාරකාර අරමුදල උපයෝගි කරගෙන ඉදිකරන ලද වී වේලන කමත් 06 ක් භෞතික පරීක්ෂාවේදී පහත දෑ නිරීක්ෂණය විය.

- ගොවි භාරකාර අරමුදල උපයෝගි කරගෙන ඉදිකරන ලද වී වේලන කමත් 06 ක් ඉදිකිරීමට පොදු ආකෘතියක් පිළියෙල නොකිරීමෙන් එක් එක් කමතෙහි වර්ගඵලයන් එකිනෙකට වෙනස් විය. තවද කමත වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම අත්‍යවශ්‍ය වුවත් වැටක් ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

- කමත් ඉදිකිරීමට ඇස්තමේන්තු සැකසීමේ දී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අදාලව නිකුත් කරන ලද මිල ගණන් සහ වවුනියා දිස්ත්‍රික් මිල ගණන් යන දෙකම යොදාගෙන තිබීම නිසා අයිතමයනගේ පිරිවැයන් කමතින් කමතට එකිනෙකට වෙනස් විය.

- කමත භාවිතය පිළිබඳ නිශ්චිත සැලැස්මක් ගොවි සංවිධාන සකසා නොතිබීමෙන් එකවර අස්වනු නෙළන කාලයකදී කමත ඉල්ලුම්කරුවන් අතරේ බෙදා හරින ආකාරය ගැටලු සහගත වී තිබුණි.

- මාමඩුව, මුහත්තන්කුලම්, මුත්තිමාරිනගර් සහ පුතුකුලම් හි ඉදිකළ කමත් නිසි ප්‍රමිතියට බොරළු දමා තලා නොතිබීම මත කමත්වල තැනින් තැන ඉරිතලා තිබුණි. 2017 අප්‍රේල් 20 දින අදාළ නිවැරදි කිරීම් කළ බවට පිළිතුරු දුන්නද නැවත 2017 අගෝස්තු 8 දින කළ භෞතික පරීක්ෂාවේ දී නිවැරදි කළ බවට පිළිතුරු දුන් නිරීක්ෂණයන් එලෙසම පැවතුණි.

**(ඇ)** ගොවි භාරකාර අරමුදලෙන් ලබා දුන් ප්‍රතිපාදන

-----------------------------------------------------

ගොවි භාරකාර අරමුදල උපයෝගී කරගෙන ඉදිකරන ලද කෘෂි ළිං 44 ක් භෞතික පරීක්ෂාවේ දී පහත දෑ නිරීක්ෂණය විය.

- DS/V/Agri/Agro/2016/14 ගිවිසුම් යටතේ ඉදිකරන ලද කෘෂි ළිදෙහි ඇස්තමේන්තු අනු අංක 8 සහ 2 අනුව පිළිවෙළින් ගැඹුර මීටර් 3.00 ත් 4.5 ත් අතර වූ මීටර් 1.5 ක ප්‍රමාණය කපරාදු කිරීම සහ පතුල වටා අඩි 01 ක් කොන්ක්‍රීට් කළ යුතු වුවත් අඩි 0.333ක් කොන්ක්‍රීට් කර තිබිය දී ඒ සඳහා එකතුව රු.40,737 ක් වැඩිපුර ගෙවා තිබුණි.
- DS/V/Agri/Agro/2016/15 ගිවිසුම් යටතේ ඉදිකරන ලද කෘෂි ළිදේ ගැඹුර මීටර් 1.5 ත් මීටර් 3.0 ත් අතර වූ මීටර් 1.5 ක් කපරාදු කළ යුතු වුවත් එකී කාර්යය ඉටු නොකර තිබිය දී රු.9,333 ක් ගෙවා තිබුණි.

- DS/V/Agri/Agro/2016/13 ගිවිසුම් යටතේ ඉදිකරන ලද කෘෂි ළිදෙහි ඇස්තමේන්තු අනු අංක 10 සහ 2 අනුව පිළිවෙළින් පැති කණු දෙක මීටර් 12.5ක ඝනකමට කපරාදු කිරීම සහ ළිං පතුල අඩි 01ක් උසට කොන්ක්‍රීට් කළ යුතු වුවත් අඩි 0.25ක් පමණක් කොන්ක්‍රීට් කර තිබිය දී ඒ සඳහා එකතුව රු.28,643ක් වැඩිපුර ගෙවා තිබුණි.

- DS/V/Agri/Agro/2016/09 ගිවිසුම් යටතේ ඉදි කර තිබුණු කෘෂි ළිදේ පතුල අඩි 01ක් උසට කොන්ක්‍රීට් කළ යුතු වුවත් අඩි 0.25 ක් පමණක් කොන්ක්‍රීට් කර තිබීය දී රු.13,467 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- DS/V/Agri/Agro/2016/08 ගිවිසුම් යටතේ ඉදි කර තිබුණු කෘෂි ළිදේ පතුල අඩි 01 ක් උසට කොන්ක්‍රීට් කළ යුතු වුවත් අඩි 0.1667 ක් උසට පමණක් කොන්ක්‍රීට් කර තිබිය දී රු.15,990 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- DS/V/Agri/Agro/2016/02 ගිවිසුම් යටතේ ඉදි කර තිබුණු කෘෂි ළිඳ සඳහා පිළියෙල කරන ලද ඇස්තමේන්තුවේ අනු අංක 08 සහ 11 ඉටු කර නොමැති බව කළ වැඩ පත්‍රිකාවේ සඳහන් ව තිබුණ ද භෞතික පරීක්ෂාවේ

දී එකී වැඩ කොටස් ඉටුකර ඇති බවත්, ඇස්තමේන්තුවේ අනු අංක 02 පැරණි ඉදිකිරීමක් වුවත් එය ඉටු කළ බව දක්වමින් රු.28, 562 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- VN/DS/PL/N/Agri/Well/2016/06 ගිවිසුම් යටතේ කෘෂි ළිද ඉදිකිරීම 2016 ඔක්තෝබර් 31 දිනට අවසන් කළ යුතු වුවත් 2017 මාර්තු 09 දින වන විටද ඉදිකිරීම නිමකර නොතිබුණි. තවද ගිවිසුමේ 10 වන ඡේදය ප්‍රකාරව ගෙවූ මුදල වූ රු.38,000ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

- VN/DS/PL/N/Agri/Well/2016/10 ගිවිසුම් යටතේ ඉදි කර තිබුණු කෘෂි ළිදේ පතුල මීටර් 0.2 ක් උසට කොන්ක්‍රීට් කළ යුතු වුවත් මීටර් 0.1 ක් පමණක් කොන්ක්‍රීට් කර තිබූ අතර, රු.6,019 ක් වැඩිපුර ගෙවා තිබුණි. තවද කෘෂි ළිද ඉදිකිරීම 2016 ඔක්තොබර් 31 දිනට අවසන් කළ යුතු වුවත් 2017 මාර්තු 09 වන විට ද ව්‍යාපෘතිය නිමකර නොතිබීම මත ගිවිසුමේ 10 වන ඡේදය ප්‍රකාරව ගෙවූ මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 අග්‍රිම ගිණුම්**

**-------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) ප්‍රකාරව කාර්යය නිම කර දින 10ක් ඇතුළත ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කල යුතු වුවත්, අවස්ථා 08කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.110,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක සිට මාස 03 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව තුළ නිරවුල් කර තිබුණි.

(ආ) 2016 නොවැම්බර් 18 දිනැති අංක 07/2016 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පත්කළ බලයලත් නිලධාරියා විසින් 2016 දෙසැම්බර් 31 දිනට පසුව මුදල් පොත්වල කිසිඳු ගනුදෙනුවක් සටහන් කළ නොහැකි පරිදි සටහන් තබා නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණ රු.මිලියන 12.35 ක් අදාල කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**(ආ)** 2015 වර්ෂයේදී අවස්ථා 12 කදී තැන්පත් කරන ලද සංචාරක බංගලා භාරකරුට ගෙවිය යුතු රු.68,120 ක් නොගෙවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-----------------------------------------------------------**

විෂය අංක 26601 දරන, රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.375,904 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබුණු ත්‍රීවිලර් රථය වර්ෂ දෙකකට අධික කාලයක් භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පාවිච්චි කරනු ලබන වාහන 07 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු ME 2, ME 10 යන නිළ නිවාස සහ පැරණි සංචාරක නිවාසය අලුත්වැඩියා කර භාවිතයට ගෙන නොතිබුණි.

**3.7 බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.1,269,443 ක් විය.

**3.8 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.1 හා 4.2.3 වගන්ති ප්‍රකාරව ණය ලබා ගැනීමට අදාල ලේඛන, ණය මුදල දෙනලද කාර්යය සඳහා යොදාගත් බවට කරනු ලබන ගෞරව බහුමාන සහතික සහ විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට බලය දෙන අවලංගු කළ නොහැකි පොරොන්දුව යන ලේඛන ණය ලිපිගොනුවල ඇතුළත් කර නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංචාරක බංගලාව ඉදිකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 ජූලි 29 දින රු.22,999,190 කට ගිවිසුම්ගතව සංචාරක බංගලාවේ පළමු හා දෙවන පියවරේ ඉදිකිරීම් කටයුතු 2015 නොවැම්බර් 29 දින අවසන් කළ යුතුව තිබුණු නමුත් 2016 අගෝස්තු 31 දින වන විට ද අවසන් කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු සාධාරණ හා තාක්ෂණික ලෙස විශ්ලේෂණය කර බැලීමෙන් තොරව කල් දිගු ලබා දීම මත කොන්ත්‍රාත් කොන්දේසි අංක 04 අනුව ප්‍රමාද ගාස්තු අය කිරීම බැහැර වී තිබුණි.

(ii) 2015 දෙසැම්බර් 28 දිනට ලබා දුන් කල් දිගුවට අනුව ඉදිකිරීම් කටයුතු නිම කල යුතු බැවින් අමතර කල් දිගුවට අදාළව ඇප බැඳුම්කරයේ වලංගු කාලය දීර්ඝ කර නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව පිළිබඳ විස්තර උචිත මාධ්‍යයක පළකර නොතිබුණි. තවද මුදල් රෙගුලාසි 20 ප්‍රකාරව මෙම ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ද සකසා නොතිබුණි.

(iv) අතිරේක වැඩ අයිතම 06 ක් වෙනුවෙන් රු.3,833,222 ක් ගෙවීම් කර තිබූ අතර එය ඇස්තමේන්තුගත වටිනාකමින් සියයට 12.1 ක් විය. තවද අතිරේක වැඩ ඉටුකිරීම සඳහා පූර්ව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

**(ආ)** RO ජලපෙරණ මිලදීගැනීම
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) RO ජලපෙරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.7 මාර්ගෝපදේශයට අනුව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවක සංයුතිය ප්‍රාදේශීය දිස්ත්‍රික් ප්‍රධානියා හෝ ඊට සමාන අයෙක් සභාපති ලෙස ද ප්‍රසම්පාදනයට අදාළ ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙක් හා වෙනත් ආයතනයක ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකු විය යුතු වුවත් ඊට පටහැනිව සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම නිලධාරීන් තිදෙනෙකු ගෙන් සමන්විත විය.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 මාර්ගෝපදේශය අනුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී තාක්ෂණික කමිටුවක් පත්කළ යුතු වුවත් එසේ පත් කිරීමකින් තොරව සහ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.01 මාර්ගෝපදේශයේ සඳහන් විධානයන්ට පටහැනිව අධිකාරි සීමාව වූ රු.500,000 ඉක්මවා වටිනාකම රු.4,238,000 ක් වූ ජල පෙරණ මිලට ගෙන තිබුණි. තවද ආයතන 5 කට වැඩි පිරිසකගෙන් ලංසු කැඳවිය යුතු වුවත් ලංසු 03 ක් මත පදනම්ව තීරණ ගෙන තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 (අ) මාර්ගෝපදේශයට පටහැනිව වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ භාණ්ඩ මිලට ගැනීමට පෙර භාණ්ඩයේ අවශ්‍යතාවය, ප්‍රමාණය ආදිය තීරණය කළයුතු වුවත් එලෙස නොකර භාණ්ඩයේ විස්තර ඇතුළත් වන අයුරින් පිරිවිතර ඉදිරිපත් කිරීමකින් තොරව මිල ගණන් කැඳවා තිබුණි.

(iv) ප්‍රසම්පාදන ලියවිලි ලියාපදිංචි කළ ආකාරය හා ටෙන්ඩර් ලියවිලි සැපයුම්කරුවන් වෙත දන්වා යැවූ ආකාරය පිළිබඳව ලිඛිත සාක්ෂි හා ඒවා ලැබුණු ආකාරය, විවෘත කළ ආකාරය සම්බන්ධයෙන් විධිමත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(v) වවුනියාව දකුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ ස්ථානගත කරන ලද ජල පෙරණ සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ භෞතික පරීක්ෂාවේ දී එකී ජල මූලාශ්‍ර පිළිබඳ ජල සම්පත් මණ්ඩලයේ නිර්දේශ ලබා නොගෙන ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් එම ජල පෙරණ භාවිතයේ දී පාරිභෝගිකයා අතුරු ආබාධ වලට ගොදුරු විය හැකි බව නිරීක්ෂණය විය.

(vi) වවුනියාව දකුණු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්ථාන 09 ක RO ජල පෙරණ 15 ක් සවිකර ඇති අතර ඉන් විගණිත දිනය වූ 2016 ඔක්තොබර් 25 වන විට ජල පෙරණ 05 ක් මාස 06ක කාලයක් තිස්සේ ක්‍රියාවිරහිත වී පැවතිණි. එමෙන්ම RO ජල පෙරණ වලට වසරක වගකීම් කාලයක් තිබුණද ජල පෙරණ සැපයුම් කළ ආයතනයෙන් ක්‍රියාවිරහිත වී ඇති RO ජල පෙරණ අළුත්වැඩියා කර ගැනීමට විගණිත දින වූ 2016 ඔක්තොබර් 25 වන විටත් අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(vii) RO ජල පෙරණ ස්ථානගත කරන ප්‍රදේශවල ජලය ලබා ගැනීමට යොදා ගන්නා ළිං වලින් වසර පුරාම ජලය ලබා ගත හැකිද යන්න පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් (Feasibility Study) සිදුනොකර RO ජල පෙරණ ස්ථානගත කර තිබීම හේතුවෙන් ළිං වල ජලය සිඳී යන කාලයේ එකී ජල පෙරණ භාවිතයෙන් තොර වූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) වවුනියාව දකුණු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නොච්චිකුලම් පාර තාර දමා සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ආයතනයකට රු.1,708,130 ක් ගෙවා තිබුණි. එකී ඉදිකිරීම් කටයුතු භෞතික පරීක්ෂාවේ දී ඇස්තමේන්තුව ප්‍රකාරව අඟල් 4 x 4 ගල් නොදමා ඊට වැඩි ප්‍රමාණයෙන් යුත් ගල් අතුරා තිබුණි. තවද මාර්ගයේ උරහිස් ඉදිකිරීමට පෙර ගල් අතුරා තාර දැමීම නිසා ගල් දෙපසට නෙරා යාමේ අවදානමක් ද නිරීක්ෂණය විය.

**(ඈ) අරුගම්පුල්ලලිච් පාර තාර දමා සංවර්ධනය කිරීම**

**---------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අරුගම්පුල්ලලිච් පාර තාර දමා සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ආයතනයකට රු.1,692,830 ක් ලබා දී තිබුණි. එම ඉදිකිරීම 2016 ඔක්තොබර් 26 දින භෞතික පරීක්ෂාවේදී මීටර් 315 ක පමණ දුරක් වූ මාර්ග තලය බොරලු යොදා සකසා ඒ මත ගල් යොදා වැඩ ආරම්භ කරමින් තිබුණි. ඉන් මීටර් 215 ක දුරක් අඟල් 4 ගල් අසුරා තිබූ අතර එකී දුර ප්‍රමාණයෙන් මීටර් 180 දුර ප්‍රමාණයක අඟල් 4 ගල් මත මැටල් යොදා මාර්ග තලනය භාවිතා කරමින් තිබූ අතර එදින සවස තාර දැමීම සඳහා තාර උණු කරමින් තිබුණි. ඒ අවස්ථාවේදි තාක්ෂණික නිලධාරියෙක් අධීක්ෂණයේ නොසිටි අතර එකී මාර්ගයේ ගල් අතුරා තලමින් තිබූ කොටසේ යොදා තිබූ ගල් පරීක්ෂා කිරීමේදී අඟල් 4 ගල් වෙනුවට අඟල් 9, 10, 11, 12 ආදී ප්‍රමාණවලින් යුත් ගල් මාර්ග තලයේ යොදා තිබුණි. එමෙන්ම මැටල් දමා තිබූ කොටසේද ස්ථාන කිහිපයක් එවැනි ප්‍රමාණ වලින් යුත් ගල් යොදා තිබූ අතර ඒවා මත අඟල් 2, අඟල් ¾ ප්‍රමාණයේ ගල් යොදා ගල් රෝල දමා තලමින් සිටි නමුත්, ප්‍රමිතියෙන් තොර ගල් යෙදීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) මාර්ගයේ ආරම්භක දුර මීටර් 100 ක ප්‍රමාණයක් ගල් අතුරා නොතිබුණු බැවින් මාර්ග මත යොදා තිබුණු බොරලු ස්ථරයේ ඝනත්වය ස්ථාන 03 කදි පරීක්ෂා කිරීමේදි ඒවායේ උස ප්‍රමාණයන් අඟල් 4 ½, 2, 2 වීම මත නියමිත ප්‍රමාණයට බොරලු නොයොදා ගල් අතුරා තාර යොදමින් පැවති බවද නිරීක්ෂණය විය.

(iii) විගණිත දින වූ 2016 ඔක්තෝබර් 26 වන දින නිම කළ දුර ප්‍රමාණය අනුව යෙදවිය යුතු කළු ගල් ප්‍රමාණය අඟල් 4 හා අඟල් 2 ප්‍රමාණයේ මීටර් කියුබ් පිළිවෙලින් 79.86 ක් හා 66.86 ක් විය. නමුත් ගෙවීම් ලේඛන වලට අනුව අඟල් 4 හා අඟල් 2 ප්‍රමාණයේ ගල් පිළිවෙලින් මීටර් කියුබ් 97.18 ක් හා 92.93 ක් විය. ඒ අනුව

පිළිවෙලින් අහල් 4 හා අහල් 2 ප්‍රමාණයේ මීටර් කියුබ් (M3) 17.32 ක් හා 26.07 ක ප්‍රමාණය වෙනුවෙන් රු. 94,400 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) විගණිත දිනය වූ 2016 ඔක්තෝබර් 27 වන දින පුදියසින්නකුලම් සායන මධ්‍යස්ථානය ඉදිකිරීම පරික්ෂා කිරීමේදී ඇස්තමේන්තුවට අනුව පාදමේ පළල අඩි 2 ක් විය යුතු වුවත් ස්ථාන 7 කදී පාදම පරික්ෂා කිරීමේදී පළල අඩි 1.8, 1.9, 1.9, 1.6, 1.8, 1.8 සහ1.9ක ප්‍රමාණයන්ගෙන් තිබුණු බව නිරීක්ෂණය විය.

(ඊ) **වවුනියාව උතුරු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ වී වේලන කමත් 13ක් ඉදිකිරීම**
**-----------------------------------------------------------------------------------------------**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතිය යටතේ වවුනියාව උතුරු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ වී වේලන කමත් 13 ක් ඉදිකර තිබුණු අතර එකි කමත් සියල්ලෙහි පැති බැම්ම තැනින් තැන ඉරිතලා ගොස් තිබුණු අතර ඇතැම් කමත්වල මැද කොටසෙහි සිමෙන්ති ගැලවී ගොස් තිබුණි. තවද කමත්වල නඩත්තු කටයුතු කිසිවෙකුට පවරා නොතිබුණි. එසේම කමත් භාවිතය සඳහා ගොවීන්ගෙන් දිනකට හෝ වරකට රු.500 සිට 1,000 දක්වා ප්‍රමාණයන්ගෙන් මුදල් අය කරන නිසා ගොවීන් කමත් භාවිතයෙන් වැළකී සිටින බව නිරීක්ෂණය විය.

(ii) ඉදිකරන ලද කමත්වල නාම පුවරුව සඳහා වැය කළ හැකි උපරිම මුදල වූ රු.6,000 ඉක්මවා නාමපුවරු 06ක් ඉදිකිරීම වෙනුවෙන් රු.34,864ක් වැඩිපුර ගෙවා තිබුණි.

(උ) වවුනියාව උතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ අක්කර 48 ක ප්‍රමාණයක් අනවසරයෙන් බොරලු කැපීමක් සිදු කලද එය වැලැක්වීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2016 නොවැම්බර් 22 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඌ) රජයේ නිලධාරින්ට නිවාස ඉදිකිරීම සඳහා පරසන්කුලම් ප්‍රදේශයේ කැලෑව අක්කර 150 ක් කපා හෙලිකර තිබුණද 2017 ජනවාරි 04 දින තෙක්ම නිවාස ඉදිකර නොතිබුණි.

(එ) වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවාසයේ රු.801,384 ක් වැය කර බිමට ටයිල් අල්ලා තිබුණු අතර පැවති සිමෙන්ති පොළව ගලවා ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තු කර නොතිබුණි. තවද උක්ත කාර්යය ඉටු කර දෙන ලෙසට ඉල්ලීමක් ද කර නොතිබුණි.

(ඒ) 1969 සැප්තැම්බර් 27 දින වසර 30ක ලීසිං ගිවිසුමකට යටත්ව මොහිදින් පල්ලියට අරාබි පාසලක් ඉදිකිරීමට දුන් ඉඩම එම කාර්යට පටහැනිව පාසල සමග කඩ කාමර 18ක් ඉදිකර ඇත. තවද ගිවිසුම අවසන් වීමෙන් පසුවද මෙම ඉඩම අදාල කාර්යයට නොයෙදීම මත නැවත අත්පත් කර ගැනිමටද කටයුතු කර නොතිබුණි.

**3.10 විසඳා නොතිබුණු විගණන ඡේද**
**--------------------------------**

2015 වර්ෂයේ 154(6) වාර්තාවේ 3.5 (ආ) ඡේදය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිල නිවාස වසර 05 ට අධික කාලයක් විවිධ රජයේ ආයතන, දේශපාලන අධිකාරියට අයත් කාර්යාලවලට සහ පුද්ගලයින්ට ලබා දී තිබීම මගින් නිළධාරින්ට නිවාස පහසුකම් ලබා දීම සීමා වී තිබුණු අතර එකී නිවාසවල කුළී ආදායම ද අහිමි වී තිබුණි.

**3.11** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

---------------------------------------

දකුණ සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම ප්‍රකාරව තැන්පත් කළ ද උපලබ්ධි නොවූ වර්ෂයක් ඉක්ම වූ මුදල් ඇණවුම් වල වටිනාකම රු.104,000 ක් විය. එසේ උපලබ්ධි නොවීමට හේතු සොයා බලා කටයුතු කර නොතිබුණි.

**3.12** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 19 | 03 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 15 | 06 | 09 | - |
| (iii) | ද්විතියික මට්ටම | 350 | 229 | 121 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 64 | 52 | 12 | 01 |
| (v) | වෙනත් | 02 | 03 | - | 01 |
| | **එකතුව** | **451** | **309** | **145** | **04** |